සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2024

# ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

නම/ විභාග අංකය:

## I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 - 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. මේවායින් ආවරණ ශාකයක් වනුයේ,
(1) එපිසියා (2) වද (3) ඉක්සෝරා (4) කෝලියාස්

02. සතුන්ට උලාකෑමට දෙන තෘණ හඳුන්වන වෙනත් නමක් වනුයේ,
(1) ගෝචර තෘණ (2) පෝෂ තෘණ (3) ගිණි තෘණ (4) පිට්ටනි තෘණ

03. බිලාන්චි කිරීමට වඩාත් සුදුසු ආහාරයකි,
(1) තක්කාලි (2) අඹ (3) පිපිඤ්ඤා (4) දෙල්

04.  මෙම සංකේතය අයත් උපාංගය වනුයේ,
(1) ස්විචය (2) බැටරිය (3) විදුලි මෝටරය (4) විදුලි පහන්

05. වියළිකෝෂයක වෝල්ටීයතාව වනුයේ,
(1) 2 V (2) 2.5 V (3) 1.5 V (4) 1 V

06. වර්ෂාව හේතුකොටගෙන මතුපිට ඇති සාරවත් පස් තට්ටුව සේදීයාම යනු,
(1) ගංවතුර (2) ඉඩෝරය
(3) පස සෝදාපාළුව (4) අජීවී බාධක සංකලනය

07. නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය මූලික සාධකයක් නොවන්නේ,
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) කාලය

08. ඉදල් නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන යෙදවුමකි,
(1) තාක්ෂණය (2) පොලිතීන් (3) තහඩු (4) රබර්

09. පඳුරු ශාකයකි,
(1) ඉද්ද (2) ෆීකස් බෙන්ජමිනා (3) දුරන්තා (4) කෝලියාස්

10. විසිතුරු පත්‍රිකා සහිත ශාකයකි,
(1) හයිඩ්‍රෙන්ජියා (2) කැලතියා (3) රෝස (4) වද

- අංක 11 - 20 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(බෝඩර් / පඳුරු / ෆීකස් / විසිතුරු මසුන් / දළ තන්තු / පෝෂක / එළ ගවයින් / බජිරි බීජ / පුන්නක්කු / ශක්තිජනක / මී ගවයන්)

11. ............................................................ භූමි අලංකරණයේ දී ශාක යොදාගන්නා ආකාරයකි.
12. ................................................................................ විශාල නුග වර්ගයට අයත් ශාකයක් වේ.
13. ඩ්‍රැසීනි ....................................................................... ශාකයකි.
14. ................................................................................ බර ඇදීමට යොදාගනී.

15. කෘෂිකාර්මික කටයුතු සඳහා ........................................................................ යොදාගනී.

16. දළ ආහාරවල .................................... අඩුයි. 17. .............................................. වැඩියි.

18. ............................................................................................ ධාන්‍යමය ආහාරයකි.

19. ............................................................................................ සත්ත්ව ආහාරයකි.

20. සුනු සහල් .................................................................................. ආහාරයකි.

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. ඉතිරි ප්‍රශ්නවලින් දෙකක් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01. (1) භූමි අලංකරණයේ දී ශාකවලින් අපේක්ෂා කරන ප්‍රයෝජන 3 ක් ලියන්න.

(2) ගෙවත්තක සතුන් ඇතිකිරීමේ වැදගත්කම පහදන්න.

(3) බ්ලාන්ච් කිරීමේ වාසි 2 ක් ලියන්න.

(4) ආහාර පිසීමේ ක්‍රම 4 ක් ලියන්න.

(5) හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි 3 ක් ලියන්න.

(6) වෙළෙඳපොළක දැකිය හැකි විෂමාචාර 4 ක් ලියන්න. (ල. 2 x 6 = 12)

02. (1) ආහාර නිෂ්පාදනයේ දී පැලඳිය යුතු ආවරණ 2 ක් නම් කරන්න. (ල. 02)

(2) ආහාරයේ සුරක්ෂිත බව රැකගැනීමට මුළුතැන්ගෙයි පැවතිය යුතු ලක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

(3) ආහාර පිසීම සඳහා සූදානම් කිරීමේ පියවර 4 ලියන්න. (ල. 02)

(4) ආහාර පිළියෙල කිරීමට ගන්නා අමුද්‍රව්‍යවල තිබිය යුතු ගුණාංග 3 ලියන්න. (ල. 03)

(මුළු ලකුණු 09)

03. (1) පහත උපාංගවල සංකේත අඳින්න.

1. බැටරිය (වියළි කෝෂය)
2. ස්වීචය
3. විදුලි මෝටරය (ල. 03)

(2) ජල නළ උපාංග වර්ග 2 ක් ලියන්න. ඒවායින් ප්‍රයෝජන 1 බැගින් ලියන්න. (ල. 02)

(3) වෙළෙඳපොළ දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියා දක්වන්න. (ල. 02)

(4) ක්‍රය ශක්තිය හඳුන්වන්න. (ල. 02)

(මුළු ලකුණු 09)

04. (1) කුඩා ව්‍යාපාර පවත්වාගෙන යාමට සංවිධානය විය හැකි විවිධ ආකාර 2 ක් ලියන්න. (ල. 02)

(2) නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය මූලික කරුණු 2 ක් ලියන්න. (ල. 02)

(3) තනි පුද්ගල ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි 2 ක් සහ අවාසි 2 ක් ලියන්න. (ල. 02)

(4) භූමි අලංකරණයක් සඳහා ආදර්ශ බිම් සැලැස්මක් ඇඳ දක්වන්න. (ල. 03)

(මුළු ලකුණු 09)

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**

## 2024 - තෙවන වාර පරීක්‍ෂණය - ප්‍රායෝගික තාක්‍ෂණ කුසලතා - 07 ශ්‍රේණිය පිළිතුරු පත්‍රය

I කොටස


(01) 1 (02) 1 (03) 1 (04) 4 (05) 3 (06) 3 (07) 4 (08) 1
(09) 1 (10) 2 (11) බෝඩර් (12) ෆීකස් (13) පඳුරු (14) එළගවයින්
(15) මී ගවයන් (16) දළ තන්තු (17) පෝෂක (18) බජිරි බීජ (19) පුන්නක්කු
(20) ශක්තිජනක (ලකුණු 1 x 20 = 20)

II කොටස - පිළිතුරු

01. (1) සෙවණ ලබාදීම / පරිසරය වර්ණවත් කිරීම / ආහාර ලබාගැනීම / කුරුල්ලන් හා සමනලුන් සඳහා ආකර්ෂණය ලබාදීම
(2) පවුලේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම / අමතර ආදායමක් ලබාදීම / පරිසරයේ ජෛව විවිධත්වය වැඩිකිරීම / ගොම පොහොර ආදිය ලබාගත හැකි වීම / ජීව වායුව ලබාගත හැකි ය.
(3) ආහාරවල එන්සයිම ක්‍රියාකාරීත්වය නැවතීම / වර්ණය වෙනස් නොවීම / අමුද්‍රව්‍යයේ පොත්ත ඉවත්කිරීම පහසු වීම
(4) පෝරණුවේ පිලිස්සීම / කර කිරීම / ජලයේ බහා තැම්බීම / ගැඹුරු තෙලේ බැදීම / හුමාලයෙන් තැම්බීම
(5) ආරම්භ කිරීම පහසු ය / ව්‍යාපාරික අවදානම බෙදීයාම / විවිධ දක්ෂතා ඇති ව්‍යාපාරික හවුල්කරුවන් සම්බන්ධ කර ගත හැකිය / වැඩි ප්‍රාග්ධනයක් ඒකරාශි කර ගත හැකිය
(6) භාණ්ඩවල මිල ප්‍රදර්ශනය නොකිරීම / නියමිත බර හා ප්‍රමාණය වෙනස් කිරීම / කල් ඉකුත් වූ භාණ්ඩ විකිණීම / ඉතිරි මුදල් නිවැරදි ව ලබානොදීම / බිල්පත් ලබානොදීම (ල. 2 x 6 = 12)

02. (1) කවාඩමක් / හිස් ආවරණ / අත් ආවරණ (ල. 02)
(2) හොඳින් ආලෝකය හා වාතාශ්‍රය තිබීම / පානීය ජල සැපයුමක් තිබිය යුතු වීම / අප ද්‍රව්‍ය බැහැරලන ක්‍රමයක් තිබීම / පිසීමට යොදාගන්නා ආම්පන්නවල ක්‍රමවත් ව අසුරා තිබීම (ල. 02)
(3) අපද්‍රව්‍ය ඉවත් කිරීම / පිරිසිදු ජලයෙන් සේදීම / පොතු ඉවත් කිරීම / හැඩගැස්වීම / පෙර ප්‍රතිකර්ම යෙදීම (ල. 02)
(4) නැවුම් බව / ස්වභාවික වර්ණය / වයනය / හැඩය තිබීම / සුදුසු පරිදි ගබඩා කර තැබීම / ඇසුරුම් කර තිබීම (ල. 03)

03. (1) බැටරිය ස්විච්චය විදුලි මෝටරය (ල. 03)




(2) සාමාන්‍ය කෙවෙනිය - තල දෙකක් එකිනෙකට සම්බන්ධ කිරීමට
වැලමිට නැම්ම - ගලායන ජලය $90^o$ හැරවීම සඳහා
ඌනිත කෙවෙනිය - විෂ්කම්භය අසමාන තල 2 ක් එකිනෙකට සම්බන්ධ කිරීම
පිළිතුරුවලට ලකුණු ලබාදීම (ල. 02)
(3) ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන් සිටීම / සමජාතීය භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම / මහා පරිමාණ සිල්ලර වෙළෙඳසල් තිබීම / මුදල් හුවමාරුව (ල. 02)
(4) පාරිභෝගිකයා අත ඇති මුදල අනුව ඔහුගේ මිලදී ගැනීමේ හැකියාවයි. (ල. 02)

04. (1) තනි පුද්ගල ව්‍යාපාර / හවුල් ව්‍යාපාර / කුඩා පෞද්ගලික සමාගම් (ල. 02)
(2) භූමිය / ශ්‍රමය / ප්‍රාග්ධනය / ව්‍යවසාය හෙවත් කළමනාකරණය (ල. 02)
(3) <u>වාසි</u>
කුඩා මුදලකින් ආරම්භ කළ හැකි ය. / ලාභය අයිතිකරුට හිමි වේ. / ව්‍යාපාරික තීරණ ගැනීම පහසු ය.
<u>අවාසි</u>
අලාභ තනි ව දරාගැනීමට සිදුවේ. / කළමනාකරණය දුර්වල වූ විට ව්‍යාපාරය බිඳවැටේ. / තනි ව ප්‍රාග්ධන මුදල් සෙවිය යුතු ය. (ල. 02)
(4) නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න. (ල. 03)

- **ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.**